# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2133/38 - 2019 ජූලි මස 24 වැනි බදාදා - 2019.07.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

සංශෝධනයයි

**උත්තම සේවා පදක්කම**

නියෝග

අංක 156/5 හා 1981 සැප්තැම්බර් මස 01 වන දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සහ අංක 1692/29 හා 2011 පෙබරවාරි මස 11 වන දින දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* ප්‍රසිද්ධ කරන ලද උත්තම සේවා පදක්කම සඳහා වන නියෝගවල 5 වන ජේදය 2018 වර්ෂය, 2019 වර්ෂය සහ 2020 වර්ෂය සඳහා පමණක් බල පැවැත්වෙන පරිදි ඉවත් කර ඒ වෙනුවට පහත දක්වා ඇති නව 5 වන ජේදය ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

සේවා රෙගුලාසි අංක 05 : ''එක් වසරක දී මෙම ප්‍රදානය සඳහා ත්‍රිවිධ සේවාවෙන් තෝරා ගනු ලබන පිරිස අදාළ වර්ෂයේ ජනවාරි මස 01 දිනට සිටින නිලධාරී සංඛ්‍යාත්මක අගයෙන් 3% ක් ද, සෙසු නිලයින් සංඛ්‍යාත්මක අගයෙන් 1% ක් ද ලෙස වෙන් වෙන් වශයෙන් සීමා කළ යුතු වේ.''

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

උදය ආර් සෙනෙවිරත්න,
ජනාධිපති ලේකම්.

2019 ජූලි මස 12 වැනි දින,
කොළඹ
ජනාධිපති කාර්යාලයේ දී ය.

08 - 315

1A - G 30584 — 42 (2019/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*